

# හමුදා කඳවුර බේරාගැන්මට දෙවරක් නොසිතා තම දිවි පිදූ වීර සෙබළ පුත්‍රයා . . . . . . .

# හසලක ගාමිණී කුලරත්න



*නිර්භය රණවිරුවෙකුගේ වීරත්වය විදහාපාමින් ගාමිණි විසින් විනාස කරන ලද කොටි බුල්ඩෝසරය අද වන්නි - යාපන A 9 මහා මාර්ගයේ එක් තැනක අයිනේ ඔහුට උපහාරයක් ලෙස ජනතා ප්‍රදර්ශනයට තබා ඇත.*



**හසලක මංසන්දියේ පිහිටුවා ඇති අද ජනතා බුහුමනට ලක්වූ හසලක වීරයාගේ පිළිරුවයි මේ.**

**හ**සලක නම් ග්‍රාමය හමුවන්නේ නුවර හරහා මහියංගනය ප්‍රදේශයට යන විට ය. එම හසලක මංසන්ධියේ වීර රණවිරුවෙකුගේ පිළිරුවක් පිහිටුවා තිබේ. ඒ **හසලක වීරයා** නමින් අද අප මුළු දැයම හඳුන්වන ගාමිණී කුලරත්න රණවිරුවාගේ ය. අලිමංකඩ හමුදා කඳවුර රුදුරු කොටින්ගෙන් බේරා ගැන්මට ජීවිතය පූජා කළ ගාමිණී කුලරත්න අපේ යුද ඉතිහාසයට නවතම පිටුවක් එක් කළ අමරණීය නාමයකි.

කන්ද උඩරට උඩුදුම්බර වයි. පී. කුලරත්න ගාමිණීගේ පියාණෝය. කුලරත්න විවාහ වීමෙන් පසු මිනිපේ යෝජනා ක්‍රමයේ හසලක, එකේ ඇළ, ඇල්හේනට පදිංචියට ගියේය. පුංචි කටුමැටි ගෙයක දුක්කර දර අතර දිවිගෙවූ මේ දෙමහල්ලන්ට දූ දරුවෝ හය දෙනෙක් ලැබුණාහ. හසලක වීර ගාමිණී ඔවුන්ගේ දෙවෙනි පුත්රුවනය. ඔහු ඉපදුණේ 1966 සැප්තැම්බර් 9 දා ය. ගාමිණීට වයස අවුරුදු 16 වෙද්දී ඔවුන්ගේ පියා මෙලොවින් සමුගත්තේය.

ගාමිණීගේ මවට දරුපවුල රැකගැන්ම දුෂ්කර කාර්‍යයක් වීය. මේ බව එවක උසස් පෙළ පන්තියේ අධ්‍යාපනය හදාරමින් සිටි ගාමිණී දුටුවේය. උසස් අධ්‍යාපනය පසෙක දැමූ ගාමිණී, පියා නැති පවුල රැක ගැන්මේ පරම චේතනා වෙන් යුද හමුදාවට බැඳුණී. හමුදා කඳවුරු කීපයකම සේවය කිරීමෙන් අනතුරුව ඔහු අලිමංකඩ (Elephant Pass) සේවයට ගියේ ය.

මේ 1990 මැයි මාසයයි. උතුරු නැගණහිර යුද පෙරමුණෙහි දරුණු සටන් ඇවිලෙමින් තිබිණ. පැවති වාතාවරණය අනුව කිලිනොච්චි හා යාපන කොටුවේ ස්ථානගත කර සිටි භට පිරිස් අලිමංකඩ කඳවුර වෙත ස්ථානගත කෙරිණ. කිලිනොච්චිය අහිමිවීමෙන් පසු අප යුදහමුදාව අලිමංකඩට පැමිණීමත් සමග යාපනය කොටුවේ සිටි භට පිරිස්ද අලිමංකඩ කඳවුරට පසුබැස්සාහ. ඒ වන විට මේජර් එච්. ආර්. ස්ටීවන් යටතේ 6 වන සිංහ රෙජමේන්තුව අලිමංකඩ සිටියේය.

මේජර් එච්. ආර්. ස්ටීවන් (මිය යනවිට කර්නල්) ගේ ස්ථාන මාරුවෙන් පසු මේජර් සනත් කරුණාරත්න අලිමංකඩ කඳවුරේ අණදෙන නිලධාරියා වශයෙන් පත්ව ආවේය. ඒ වනවිට අලිමංකඩට තිබූ එකම සැපයුම් මාර්ගය වූයේ ගුවන් සැපයුම් මාර්ගය පමණි. කොටින්ගෙන් එල්ල වන 5 සීරෝ හා මෝටාර් ප්‍රහාර හමුවේ ඒ වනවිටත් අලිමංකඩ කඳවුරට හෙලිකොප්ටර් යානා ගොඩබැස්සවීම දුෂ්කර විය. ඒ නිසා අලිමංකඩට අවශ්‍ය දෑ ගුවන් මගින් සැපයුණේ දින 10 කට වරකි.

දිනය 1991 ජූලි 09 වෙනිදාය. පසු දින එනම් 10 දා අලිමංකඩ කඳවුර වෙත ගුවන් මගින් භාණ්ඩ රැගෙන ඒමට නියමිතව තිබිණ. 09 වෙනිදා පලාලි සිට හෙලිකොප්ටරයක් අලිමංකඩට පැමිණියේය. එයට ගොඩවූ කඳවුරේ දෙවෙනි අණදෙන නිලධාරි ලලිත් බුද්ධදාස ප්‍රදේශයේ තත්වය නිරීක්ෂණය කළේය. මේ පරීක්ෂණය සිදු කළේ පසු දින ගුවනින් භාණ්ඩ රැගෙන ඒමට නියමිතව තිබූ නිසාය. අලිමංකඩට කොටි ප්‍රහාරයක් එල්ල විය හැකි බවට ඒ වන විටත් හමුදා බුද්ධිඅංශ අනතුරු හඟවා තිබුණි. මේ කළ නිරීක්ෂණයේදී කිසිදු සැක සහිත දෙයක් දක්නට නොහැකි විය.

පසු දිනට එළිවෙමින් තිබුණි. යාන්තම් එළිය මැද අළුයම 4.30 ට පමණ එක්වර මෝටාර් හා කාලතුවක්කු ප්‍රහාරයක් කඳවුරට එල්ල විය. නිදිවරා ගෙන ආරක්ෂක සේවයේ යෙදී සිටි මේජර් ලලිත් බුද්ධදාස වහාම මේ තත්වය ඉහළට දැනුම් දී තම සෙබළුන් ලවා ප්‍රතිප්‍රහාර එල්ල කරන්නට වීය.

කොටින්ගේ ප්‍රහාරයෙන් මේජර් ලලිත් බුද්ධදාසට තුවාල සිදුවුණි. අණදෙන නිලධාරි මේජර් සනත් කරුණා රත්න 600ක පමණ භට පිරිස් මෙහෙයවමින් කොටි ත්‍රස්තයින්ට දිගටම ප්‍රතිප්‍රහාර එල්ල කළේ ය.

තවත් ටික වේලාවකින් පසු පලාලි කඳවුර සමග ගුවන්විදුලි සම්බන්ධකම් පවත්වමින් තුවාලකරුවන් රැගෙන යාමට ගුවන් ආධාර ඉල්ලා සිටීමට මේජර් කරුණාරත්නට සිදුවිය. ඒ වන විටත් මේජර් බුද්ධදාස ඇතුළු සෙබළු හතර දෙනෙක් කොටි ප්‍රහාරවලින් තුවාල ලබා සිටියහ.

පලාලි අණදෙන නිලධාරියා වූයේ සුනිල් කබ්රාල්ය. ඔහුගේ අණ පරිදි පලාලි වලින් අහසට නැගුණු හෙලිකොප්ටර් දෙකක් අලිමංකඩ කඳවුරට පහත් කිරීමට ගුවනේ කැරකෙමින් සිටියේය. එහෙත් එය අති දුෂ්කර ව්‍යායාමයකි. කොටි සීරෝ 5 ප්‍රහාර යන් ගුවනට ද එල්ල කරමින් සිටියහ.

එදින උදෑසන 7.30 ට පමණ නැවත හෙලිකොප්ටරය පහත්කිරීමට උත්සාහ කළද කොටි ප්‍රහාර හමුවේ එම ප්‍රයත්නය අසාර්ථක විය. යළිත් උදේ 930 ට පමණ ගත් උත්සාහයද හරිගියේ නැත. මේ අතර කොටින්ට එරෙහිව ජාතිය වෙනුවෙන් වීරෝදාර සේවයක් කරමින් දරුණු තුවාල ලබා සිටි මේජර් ලලිත් බුද්ධදාස සදහටම නෙත් පියාගත්තේය.

මෙකල්හි යාපනයේ ආරක්ෂක සේනා ආඥාපති වශයෙන් සේවය කළේ බ්‍රිගේඩියර් විජය විමලරත්නය. දෙවන සේනාංකයේ සේනාධිපති ලෙස මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව කටයුතු කළේය.

තමා සති දෙකක් ඇතුළත සහායක සේනා සමග අලිමංකඩට පැමිණෙන බවත්, නොබියව සතුරාට මුහුණ දෙන ලෙසත් ජෙනරාල් කොබ්බෑකඩුව මේජර් කරුණාරත්නට දැන්වූයේ ඔවුන්ගේ සිත්වලට ශක්තියේ ප්‍රාණවායුව පිඹිමිනි.

10 වෙනිදා රාත්‍රිය එළඹෙමින් තිබිණ. තුවාලකරුවන් රැගෙන යාමට හෙලිකොප්ටරයක් පැමිණියත් එයටද කිලිනොච්චිය පැත්තෙන් මෝටාර් වෙඩි වදින්නට විය. එම රාත්‍රියේ කිලිනොච්චිය ප්‍රදේශයෙන් අමුතුම මාදිලියේ ප්‍රහාරක රථයක් පැමිණෙන බව භට පිරිසට දැකගන්නට ලැබිණ. එක්වරම භූතයෙකු මෙන් මතුවූ මෙම අද්භූත වාහනය කඳවුරේ සියඹලා ගසක් ද පෙරළාගෙන ඉදිරියට එන්නට විය. ඒ එක්කම එම රථයෙන් දිගට හරහට ප්‍රහාර එල්ල කරන්නට ද වීය. අඳුර ඉරාගෙන පැමිණි මෙම යක්ෂ වාහනයේ ප්‍රහාර හමුවේ සෙබළු කරකියාගත හැකි කිසිවක් නැතිව අන්දමන්ද වූහ.

හමුදාවේ 11 ක් තුවාල ලැබූහ. එහෙත් අභීත රණවිරුවෝ මේ කොටි ප්‍රහාර හමුවේ ආර් පී වෙඩි වැස්සක් එල්ල කළහ. අද්භූත කොටි යක්ෂයා පළාගියේය.

මේ 11 වෙනිදා රාත්‍රියයි. නැවතත් අයියකච්චි ප්‍රදේශයෙන් ප්‍රහාර පටන්ගෙන තිබිණ. 12 දා සහ 13 වෙනිදා සුළු වෙඩි ප්‍රහාර එල්ල විය. 14 වෙනි දා උදාවිය. එදා මාසෙ පෙහොය දිනයකි. කුට්ටි කැපිය හැකි කළුවරෙන් මුළු ප්‍රදේශයම වැසී තිබුණි. මේ ඝණ අඳුරේ කොටි ප්‍රහාරයක් එල්ල විය හැකියයි බුද්ධි අංශ දැනුවත් කර තිබුණි. රාත්‍රි 7 පමණ වනවිට මෝටාර් හා කාලතුවක්කු හඬින් කඳවුරු ප්‍රදේශය දෙදරන්නට වීය. මේ භීෂණ ප්‍රහාර සමග කලින් පැමිණි කොටි ප්‍රහාරක රථද අඳුර පීරාගෙන කඳවුර දෙසට එන්නට පටන්ගත්තේ හොල්මන් අවතාර මෙනි.

කොටින්ගේ දැවැන්ත ප්‍රහාර හමුවේ කඳවුර තුළ බරපතළ තත්වයක් උදාවිය. අණදීම අපහසු විණි. මේ නිසා තම තමන්ගේ හැකියාව අනුව සටන් කරන්නැයි කඳවුරේ සියළු භට පිරිසට අණ ලැබිණ.

මේ භීෂණකාරී පරිසරය මැද කඳවුරේ දකුණු පස බංකරයක ලාන්ස් කෝප්‍රල් වරුන් වන ගාමිණී කුලරත්න සහ පීටර් සිටියහ. හමුදාවේ **R P G** ප්‍රහාර නොතකා කොටි බුල්ඩෝසරයක් ඉදිරි ආරක්ෂක වලල්ල බිඳගෙන කඳවුර දෙසට එන බවත් ඒ පිටුපසින් වියරු වැටුණු කොටි 600 ක් පමණ එන බවත් ගාමිණී සහ පීටර් දුටුවෝය. යුද්ධ ටැංකියක් මෙන් පෙනුණු දැවැන්ත කොටි බුල්ඩෝසරය කඳවුරේ ප්‍රධාන කාර්යාලය වෙතට එක එල්ලේ ඇදී යන්නට වීය.

තව මොහොතකින් මුළු කඳවුරම වැලි ධූලි බවට පත්වන බව ගාමිණීට තේරුම් ගියේය. තම ජීවිතයට වඩා කඳවුරේ සිටින සෙබළුන්ගේ ජීවිත බේරාගැනීම ඔහුගේ ක්ෂණික තීරණය විය.

ගණ අඳුර බිඳ කොටි බුල්ඩෝසරය දරුණු යක්ෂයෙකු මෙන් ඉදිරියට ඇදේ. රුදුරු කොටි ප්‍රලයව කැගසමින් ඉදිරියට එති. ලාන්ස් කෝප්‍රල් ගාමිණී කුලරත්න අත් බෝම්බ දෙකක් දෑතට ගෙන බංකරයෙන් එළියට පැන්නේය. කොටි ඔහු ඉලක්ක කරමින් වෙඩි තබන්නට වූහ. ගාමිණී ඒ කිසිවක් නොතකා අභීතව බුල්ඩෝසරය දෙසට දුවයනු පීටර් දුටුවේය. ඔහු තම සගයා බේරාගැන්මට කෑගැවේය.

එහෙත් ගාමිණීට ඒ කිසිවක් ඇසුණේ නැත. ඔහුගේ එකම අභිප්‍රාය වූයේ තම කඳවුර බේරාගැනීමයි. කොටි වෙඩි පහරකමින් දිවගිය ගාමිණී මාරක බුල්ඩෝසරයේ ඉනිමගේ එල්ලුනේය. තම අත්දෙකේ සුරැකි බෝම්බ දෙක බුල්ඩෝසරය ඇතුළට දමනු පීටර් දැක්කේය.

තවත් මොහොතකි ගතවූයේ. ප්‍රචණ්ඩ අලියෙකු මෙන් ඉදිරියට පැමිණි කොටි බුල්ඩෝසරය කෑලි කෑලි වලට පුපුරා ගියේය. ලාන්ස් කෝප්‍රල් ගාමිණී ඉවතට විසිවිය. මේ අභීත ක්‍රියාවෙන් පන්නරය ලැබූ හමුදා භටයෝ කොටියන්ට දිගින් දිගටම වෙඩිතබන්නට වූහ. කොටි පලා ගියෝය.

වෙඩි උණ්ඩ රැසකින් හිල්වී තිබුණු ලාන්ස් කෝප්‍රල් ගාමිණී කුලරත්නගේ සිරුර පසු දා සොයාගන්නා ලදී.

සෙබළෙකුගේ එම සුවිශේෂ වීර ක්‍රියාව සිදු නොවන්නට අලිමංකඩ යුද කඳවුරද 600 කට වඩා යුද හමුදා පිරිසද මුළුමනින් විනාශවනු නොඅනුමානය. මියගිය ගාමිණී කුලරත්න කෝප්‍රල් තනතුරට උසස් කරමින් ඔහුට **පරම වීර විභූෂණ** නම් එතෙක් යුද ඉතිහාසයේ කිසිවෙකුට පිරිනොනැමුණු උසස්ම සම්මානය පිරිනමන ලදී. එම සම්මානය ඇරඹුණේ ඔහුගෙනි.

හසලක හරහා යන බොහෝ ජනතාව මේ අභීත රණවිරුවාගේ පිළිරුවට ගෞරවය පුදමින් එතැන මොහොතක් නැවතී සිට යති. ජාතිය වෙනුවෙන් දිවිපිදූ මෙම වීර තරුණයාට ජනතාව මෙන්ම රජයද සම්මාන පුදා ගෞරව කළේය. මෑත ඉතිහාසයේ ඔහු කළ අභීත, එමෙන්ම අසමාන වූ මේ ක්‍රියාව ජාතියක් ලෙස අපට අභිමානය ද, ඉමහත් ධෛර්‍යය ද ගෙන එයි. අපි එය නැවත නැවත අනුස්මරණය කළ යුතු වෙමු.

***ශ්‍රීලංකාවේ පළවන රිවිර පත්‍රයේ ආරක්ෂක මාධ්‍යවේදී***

**♦ තිස්ස රවීන්ද්‍ර පෙරේරා විසිනි**

**British War Memorial Inscription**

**When you go home**
**Tell them of us and say**
**That we gave our**
**tomorrow**
**For your today**

**නැතත් කිසිවක් රැකෙන්නට**
**හෝ නැසෙන්නට යනුවෙන්**
**හිතක් එඩිතර වීය හෙළයින්**
**අතර ලොව දිනුවෙන්**
**ගෙදර ගිය විට ගෙදර අය**
**හට කියනු මෙය සුළුවෙන්**
**අපේ හෙට දින පිදූ බව අප**
**ඔබේ අද වෙනුවෙන්**